# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2087/81 – 2018 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා – 2018.09.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: සී.අයි/1794.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ.පෙ. 906හි පිහිටා ඇති කලම්බු ඩොක්යාඩ් පී එල් සී සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906හි පිහිටා ඇති ස්වාධීන තටාක සේවක සංගමය අතර 2018 ජුනි මස 25 වන දින ඇතිකර ගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.

2018 අංක 25 දරන සාමූහික ගිවිසුම

**කලම්බු ඩොක්යාඩ් පීඑල්සී**

**සහ**

**ස්වාධීන තටාක සේවක සංගමය**

මෙම සාමූහික ගිවිසුම 2018 වර්ෂයේ ජුනි මස 25 වන දින කාර්මික ආරවුල් පනත අනුව ශ්‍රී ලංකාවේ විධිමත් පරිදි ලියාපදිංචි කළ සමාගමක් වන එහි ලියාපදිංචි කාර්යාලය කලම්බු ඩොක්යාඩ් පීඑල්සී, කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906හි ඇති (මින් මතු සේව්‍යයා යනුවෙන් සඳහන් කරනු ලබන) කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ ශ්‍රී ලංකාවේ විධිමත් පරිදි ලියාපදිංචි කළ වෘත්තීය සමිතියක් වන සහ එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906හි පිහිටා ඇති (මින් මතු සංගමය යනුවෙන් සඳහන් කරනු ලබන) ස්වාධීන තටාක සේවක සංගමය අතර ඇතිකරගත් සාමූහික ගිවිසුමය.

01. ***ශීර්ෂ නාමය.*** – මෙම ගිවිසුම කලම්බු ඩොක්යාඩ් පී එල් සී සේවක සාමූහික ගිවිසුම 2018 - 2020 යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ***ආවරණය වන සහ බැඳෙන පාර්ශ්වයන්.*** – මෙම ගිවිසුමෙන් සේව්‍යයා, සංගමය සහ එකඟතාවයකට පැමිණීමට නියමිත වැටුප් පරිමාණයන්ට අදළ සේවා කාණ්ඩවල, ස්ථිර සේවා ගිවිසුම් මත සේව්‍යයා විසින් සේවයේ අනුයුක්ත කර ඇති, සංගමයේ සාමාජිකයින් හා සියළු සේවකයින් ආවරණය වන සහ බැඳෙනු ලැබේ.

03. ***ගිවිසුම බලපවත්වන කාල පරිච්ඡේදය.*** – මෙම ගිවිසුම 2018 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වී 2020 දෙසැම්බර් මස 31 වන දින දක්වා අඛණ්ඩව බලාත්මක වනු ලැබේ.

04. ***ප්‍රතිපත්ති ප්‍රකාශනය.*** – මෙම ගිවිසුම ඇති කර ගැනීමට ප්‍රථම බලපැවැත්වූ සාමූහික ගිවිසුම්වල (වගු අංක 01) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඇතිකර ගන්නා ලද එකඟතාවයන් එලෙසම ක්‍රියාත්මක වනු ඇත. මෙම ගිවිසුමට අදළ වන සේවා කොන්දේසි සහ නියමයන් වෙනස් නොකිරීමට හෝ විකෘති නොකිරීමට සේව්‍යයාද, සේවකයින්ද, සංගමය ද ඒකාබද්ධව ගිවිස ගනී. මෙම ගිවිසුම බලාත්මකව පවතින කාලසීමාව තුළ ගිවිසුමේ ප්‍රතිපාදනයන් අභිබවා යන පරිදි වෙනත් පාර්ශ්වයන් සමග එකඟතාවයකට එළඹීමට සේව්‍යයා හෝ සංගමය කටයුතු නොකරනු ඇත. කෙසේ වෙතත් අනපේක්ෂිත තත්ත්වයක් හේතුකොට ගෙන ආයතනය තුළ ඇතිවන්නා වූ අර්බුදකාරී අවස්ථාවක දී මෙම ගිවිසුමේ සඳහන් කරුණු නැවත සලකා බැලීමට හෝ අවශ්‍යතාවය මත දෙපාර්ශ්වයේම එකඟතාවය අනුව මෙම ගිවිසුමට සංශෝධන ඉදිරිපත් කිරීමේ අයිතිය ඇත.

ආයතනය හෝ සේවකයන් සම්බන්ධයෙන් එහි/ඔවුන්ගේ ඵලදයිතාවය, මනා කාර්ය සාධනය, කාර්යක්ෂමතාවය සහ සංවර්ධනය උදෙසා තුඩු දෙනවා යැයි පාලනාධිකාරිය විසින් විශ්වාසය තබන ඕනෑම ආකාරයේ යෝජනා හෝ කරුණු පිළිබඳව පාලනාධිකාරය ඉල්ලා සිටින විටදී පූර්ව කොන්දේසියකින් තොරව සාකච්ඡා සඳහා එළඹීමට දෙපාර්ශ්වය එකඟ වේ.

එමෙන්ම ඉහත සඳහන් කරුණුවලට අදළව සංගමය විසින් පාලනාධිකාරියෙන් ඉල්ලා සිටින විටදී පූර්ව කොන්දේසියකින් තොරව සාකච්ඡා සඳහා එළඹීමට ද දෙපාර්ශ්වය එකඟ වේ.

වගු අංක 01

| ගිවිසුම් වර්ෂය | වගන්ති අංකය | කරුණ |
|---|---|---|
| 1999-2001 | 12 | ප්‍රසාද මුදල් |
| | 20 | සේවකයෙකුගේ මරණය |
| | 24 | දැනට භුක්ති විඳිනු ලබන හිමිකම් / ප්‍රතිලාභ සහ සහන |
| 2002 – 2004 | 9 | සේවක පුරප්පාඩු (ඇ/ඈ වගන්තිය තවදුරටත් බල නොපානු ඇත.) |
| | 14 | වෛද්‍ය පරීක්ෂණවලට යොමුකිරීම |
| | 20 | සේවක වෘත්තීය අධ්‍යාපනය |
| | 23 | මැතිවරණ, ඇඳිරි නීතිය පැනවීම යනාදී නිවාඩු |
| | 25 | විදේශ ගතවීම සඳහා පඩිරහිත නිවාඩු |
| | 27 | ස්ථාන මාරුවීම් |
| | 28 | දිවා/රාත්‍රී ආහාර විවේකය |
| | 29 | කාර්මික ආරක්ෂාව |
| | 30 | ආයතනයේ විනය පවත්වාගෙන යෑම |
| | 32 | කාර්මික ආරවුල් බේරුම් කිරීම |
| 2005-2007 | 06 | වැටුප් පරිමානයන් හා වැටුප් වර්ධක (ආ වගන්තිය නොවෙනස්ව පවතිනු ඇත) |
| | 14 | වෘත්තීය සමිතියේ වාර්ෂික මහාසභා රැස්වීම |
| | 16 | Stand by අවස්ථාවකදී වෙනත් අංශයක රාජකාරිය සඳහා යෙදවීම |
| 2008-2010 | 05(ii) | වාර්ෂික කාර්යය සාධනය ඇගයීමේ ක්‍රියාපටිපාටිය |
| | 05(iv) | අතිකාල ගණනය |
| | 05(v) | අතිකාල ගණනය කිරීම විධිමත් කිරීම |
| | 06 | උපයනවිට ගෙවීමේ බද්ධ අඩුකිරීම |
| | 07(i) | විශ්‍රාමික පාරිතෝෂික දීමනා |
| | 08 | රන් තිළිණ ප්‍රදානය |
| | 09 | උසස්වීම් (ii පලමු වගන්තිය,iii,iv,v) |
| | 12 | උදෑසන ආහාරවේල නොමිලේ ලබාදීම |
| | 13(i)(ඈ) | රජයේ රෝහලක ප්‍රතිකාර ලබාගැනීමේදී සිදුකරනු ලබන ගෙවීම් (දෙවන කොටස) |
| | 13(i)(ඇ) | වෛද්‍ය උපකරණ |
| | 13(i)(ඉ) | වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන දුදරුවන්ගේ වයස් සීමාවන් |
| | 13(i)(ඊ) | සතුන් සපාකෑම |
| | 13(i)(උ) | බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම |
| | 13(ii)(අ) | වෛද්‍ය යැපීම් දීමනාව |
| | 14 | වැඩ පැවරීමේ පත් |
| 2011-2013 | 04 | ප්‍රතිපත්ති ප්‍රකාශනය |
| | 05 (ඇ) | වැටුප් හා දීමනා |
| | 06 | වාර්ෂික කාර්යය සාධනය ඇගයීමේ ක්‍රියාපටිපාටිය |
| | 07 | සේවක පුරප්පාඩු (පළමුවෙනි කොටස) |
| | 10 | නව වැටුප් පරිමානයක් හඳුන්වාදීම |
| | 11 | සේවය ස්ථිර කිරීම |

| ගිවිසුම් වර්ෂය | වගන්ති අංකය | කරුණ |
|---|---|---|
| 2014-2016 | 04 | ප්‍රතිපත්ති ප්‍රකාශනය |
| | 07 | ලිපිකාර ශ්‍රේණියට බඳවා ගැනීම |
| | 08 | කෙටිකාලීන විදේශ පුහුණු පාඨමාලාව |
| | 09 | යාත්‍රා අංශයේ රාජකාරියේ නියැලෙන සේවක මහතුන් |
| | 10 | නිවාඩු අනුමත කිරීමේ බලතල ලබාදීම |
| | 11 | ගැඹුරු මුහුදේ රාජකාරී කටයුතු වල නියැලීමෙන් පසු ලබාදෙන විවේක දිනයන් |
| | 12 | ජංගම දුරකතන සිම්පත් ලබාදීම |
| | 13 | රාජකාරී කටයුතු සඳහා යතුරුපැදි භාවිතා කිරීම |
| | 14 | සේවක මහතුන්ගේ වැඩ/හැසිරීම පිලිබඳව ධනාත්මක හෝ ඍණාත්මක සිද්ධීන් පරීක්ෂනකගත කිරීම (Critical Incident) |
| | 17 (i)(ආ) | ආයතනයේ අනුග්‍රහය යටතේ ලංකා බැංකුව මගින් ලබාදෙන නිවාස ණය මුදල |
| | 17 (iv) | හඳුනාගත් නිදන්ගත රෝගී තත්වයට මුහුණදී ඇති සේවක මහතුන් තෝරාගෙන ඔවුන්හට වසරකට වරක් උපදේශනාත්මක සේවාවක්/සායනයක් පැවැත්වීමට කටයුතු කෙරේ |
| | 17 (vii) | අවමංගල අවස්ථාවන් (දෙවන කොටස) |
| | 17 (x) | සුබසාධන පහසුකම් සේවා ගාස්තු සංශෝධනය |

**05** වැටුප් හා දීමනා :

| වර්ෂය | මූලික වැටුප වෙනුවෙන් | දීමනාවන් වෙනුවෙන් |
|---|---|---|
| 2018 | රු. 3,000/- ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම් කොට ගෙන වර්ෂයකට රු.125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ. | පවතින දීමනාව 5% කින් වැඩි කෙරේ |
| 2019 | රු. 3,000/- ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම් කොට ගෙන වර්ෂයකට රු.125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ. | පවතින දීමනාව 5% කින් වැඩි කෙරේ. කෙසේ වුවද, ආයතනයහට මූල්‍යමය අර්බුදකාරී තත්වයකට මුහුණදීමට සිදුවුවහොත් මෙම ගිවිසුමේ 4 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ඇත. |
| 2020 | රු. 3,000/- ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම් කොට ගෙන වර්ෂයකට රු.125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ. | පවතින දීමනාව 5% කින් වැඩි කෙරේ. කෙසේ වුවද, ආයතනයහට මූල්‍යමය අර්බුදකාරී තත්වයකට මුහුණදීමට සිදුවුවහොත් මෙම ගිවිසුමේ 4 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ඇත. |

06 *සේවක උසස්වීම්.* –

(i) ශ්‍රේණි අතර උසස්වීම්

වාර්ෂික වේතනාධික පිරිනැමීම සඳහා සිදුකරන කාර්යය සාධන ඇගයීම් වාර්තාව පදනම් කොට ගෙන ශ්‍රේණි අතර උසස්වීම් ලබාදීම සිදුකරන අතර, මෙමගින් මෙතෙක් උසස්වීම් ලබාදීමේ දී ක්‍රියාත්මක වූ ලිඛිත / වෘත්තීය පරීක්ෂණය අහෝසි කිරීමට ද, ඒ අනුව කාර්යය සාධන ඇගයීමේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ශ්‍රේණි උසස්වීම් ලබාදීමේ නව ක්‍රමවේදය අනුව හිමිවන මුළු ලකුණු ප්‍රමාණය 65% හෝ ඊට වැඩි නම් ශ්‍රේණි අතර උසස්වීම් ලබාදීමට ද කටයුතු කරනු ඇත.

මේ සඳහා ලකුණු ලබාදීම පහත සඳහන් පරිදි සිදුකරනු ඇත.

| | | | |
|---|---|---|---|
| * | පෙර වර්ෂයේ කාර්යය සාධනය පදනම් වූ ඇගයීම | ලකුණු | 20 |
| * | සේවා කාලය වසරකට ලකුණු 1/2 බැගින් උපරිම | ලකුණු | 15 |
| * | පැමිණීම | ලකුණු | 10 |
| * | නියමිත වේලාවට සේවයට වාර්තා කිරීම | ලකුණු | 10 |
| * | විනය වාර්තාව | ලකුණු | 10 |
| * | පෙර වර්ෂයේ මුල් මාස 06 තුළ නිවාඩු ලබාගැනීම | ලකුණු | 15 |
| * | දෙපාර්තමේන්තු / කොට්ඨාස ප්‍රධානීන්ගේ ඇගයීම | ලකුණු | 20 |
| | | මුළු ලකුණු ප්‍රමාණය | 100 |

වර්ෂයේ මුල් මාස 06 තුළ නිවාඩු ලබාගැනීමට අදළ ලකුණු 15 පිරිනැමීම පහත සඳහන් පරිදි සිදුකරනු ඇත.

| | | | |
|---|---|---|---|
| * | නිවාඩු දින 15 හෝ ඊට අඩුවෙන් නිවාඩු ලබාගෙන ඇත්නම් | ලකුණු | 15 |
| * | නිවාඩු දින 15.5 සිට 16 දක්වා | ලකුණු | 12 |
| * | නිවාඩු දින 16.5 සිට 17 දක්වා | ලකුණු | 09 |
| * | නිවාඩු දින 17.5 සිට 18 දක්වා | ලකුණු | 06 |
| * | නිවාඩු දින 18.5 සිට 19.5 දක්වා | ලකුණු | 03 |
| * | නිවාඩු දින 20ක් හෝ ඊට වැඩි | ලකුණු | 00 |

එසේ වුවද නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් 2011 - 2013 සාමූහික ගිවිසුමේ 5 (ඇ) වගන්තිය ප්‍රකාරව අභියාචනා සලකා බැලීමට ද එකඟ වේ.

සෑම වසරකම ජනවාරි මස 01 වන දින වන විට වර්තමාන ශ්‍රේණියේ වසර 04ක් සම්පූර්ණ කරන ලද සේවක මහතුන් හා කොට්ඨාස ප්‍රධානීන්ගේ නිර්දේශය මත වර්තමාන ශ්‍රේණියේ වසර 03ක් සම්පූර්ණ කරන ලද සේවක මහතුන් ශ්‍රේණි අතර උසස්වීම් සඳහා සුදුසුකම් ලබනු ඇත.

තව ද පසුගිය වර්ෂය ඇතුළත පඩි රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් හෝ වාර්ෂික කාර්යය සාධන ඇගයීමේ දී පැමිණීම, කලට වේලාවට සේවයට වාර්තා කිරීම හෝ විනයට අදළව ලබාගත් ලකුණු සංඛ්‍යාව '0' වෙන අවස්ථාවක දී හෝ අදළ වැටුප් පරිමාණයේ ඉහළම ශ්‍රේණියට ළඟාවී ඇති සේවක මහතුන් ශ්‍රේණි අතර උසස්වීම් සඳහා නුසුදුසු වේ. තව ද වැඩ තහනමකට ලක්වීම අදළ වර්ෂය ද ඇතුළුව ඉදිරි වසර 3ක් සඳහා ශ්‍රේණි උසස්වීම් ලැබීමට නුසුදුසුකමක් වන අතර, සේවය අත්හිටුවීමේ දී එය ඉදිරි වසර 2ක් සඳහා වේ.

සේවකයෙකු තම වෘත්තියට අදළ උසස් පුහුණුවීම් පාඨමාලා සම්පූර්ණ කර ඇති අවස්ථාවක වර්තමාන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 02ක් සම්පූර්ණ කර ඇති නම්, එම සේවක / සේවිකාවන් තම සේවා කාණ්ඩයට අදළ (Work Category – Industrial, Supervisior, Foreman or Clerical) ඉහළ ශ්‍රේණියට උසස් කිරීමට සුදුසුකම් ලබනු ඇත.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් අවසාන තීරණය ගනු ලබන්නේ අංශ ප්‍රධානියාගේ නිර්දේශය මත සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන හා පාලන) විසිනි. තව ද, එසේ ඉහළ ශ්‍රේණියට උසස් කිරීමේ දී වැටුප් වර්ධක 02ක් පිරිනමන අතර, මෙය හිමිවනුයේ සේවා කාලය තුළදී එක් සේවකයෙකුට එක් අවස්ථාවක් සඳහා පමණි.

(ii) තනතුරු අතර උසස්වීම්

කාර්මික ශ්‍රේණියේ සිට පරිපාලක ශ්‍රේණියට උසස් කිරීමේ දී පරිපාලක ශ්‍රේණි වර්ගීකරණයට අනුව පහත අගයන් මූලික වැටුපට එකතු කරනු ඇත.

| | |
|---|---|
| ප්‍රාථමික (Primary) | රු. 1,400.00 |
| ද්විතීයික (Secondary) | රු. 1,150.00 |
| සහායක (Support) | රු. 900.00 |

(iii) සේවකයෙකු ආයතනයේ ස්ථිර සේවයට අනුයුක්ත වීමේ දී අදළ වර්ෂයේ මුල් මාස 06 තුළ අනුයුක්ත වී ඇත්නම් ශ්‍රේණි අතර උසස්වීම් ලබාදීමේ දී අදළ කාලය වසරක් සේ සලකනු ඇත. කෙසේ වෙතත් මෙය සලකා බලනු ලබනුයේ වසර 04 සම්පූර්ණ කිරීමේ දී පිරිනමනු ලබන ශ්‍රේණි අතර උසස්වීම් ලබාදීමේ දී පමණි.

(iv) සුප්‍රා ශ්‍රේණි උසස්වීම්

ලිපිකාර පාර්ශ්වයට අදළ සුප්‍රා ශ්‍රේණිය සඳහා උපරිම 20 සංචිතයක් පවත්වාගෙන යාම.

07. *පරිපාලක ශ්‍රේණි සඳහා සේවක පුරප්පාඩු පිරවීමේදී–* වැඩ මූලික හා පරිපාලක වෘත්තීන් සඳහා බඳවාගනු ලබන සේවක මහතුන් අතුරින් 35%ක් සමාගමෙන් පිටත අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම පිළිබඳව පාර්ශ්වයන් එකඟ වන අතර එය පුහුණු කිරීමේ උපදේශක කමිටුවේ නිර්දේශය මත සිදුකරනු ඇත.

## 08 CDL කොන්ත්‍රාත් පදනමට අදාල වැටුප් හා දීමනා

<table>
<tr><th colspan="3">විෂයය</th><th>2018</th><th>2019</th><th>2020</th></tr>
<tr><td colspan="3">මූලික වැටුප් වැඩිවීම</td><td>රු. 2,250/=</td><td>රු. 2,250/=</td><td>රු. 2,250/=</td></tr>
<tr><td rowspan="6">පැමිණීමේ දීමනාව</td><td rowspan="2">පැස්සුම්කරුවන් හා වානේ තහඩු පිරිසැකසුම්කරුවන්</td><td>කාර්මික ශ්‍රේණි</td><td>294.77</td><td>309.51</td><td>324.99</td></tr>
<tr><td>පරිපාලක ශ්‍රේණි</td><td>336.87</td><td>353.71</td><td>371.40</td></tr>
<tr><td rowspan="2">අනිකුත් කාර්මික වෘත්තීන්</td><td>කාර්මික ශ්‍රේණි</td><td>252.66</td><td>265.29</td><td>278.55</td></tr>
<tr><td>පරිපාලක ශ්‍රේණි</td><td>294.77</td><td>309.51</td><td>324.99</td></tr>
<tr><td colspan="2">ලිපිකරුවන් හා අනිකුත් වෘත්තීන්</td><td>228.21</td><td>239.62</td><td>251.60</td></tr>
<tr><td colspan="5">පැමිණීමේ දීමනාව සඳහා නියමිත මාසයේදී සේවයට වාර්තා කල යුතු අවම දින ගණන සපුරා තිබිය යුතුය.</td></tr>
<tr><td>වාර්ෂික වේතනාධිකයන්</td><td colspan="5">ඇගයීමක් සිදුකිරීමෙන් අනතුරුව පඩි රහිත නිවාඩු ලබා නොගත් සේවක මහතුන් හට පමණක් උපරිම වශයෙන් වේතනාධික 02 ක් ලබාදීමට කටයුතු කෙරේ. එක් වේතනාධිකයක අගය රු.329/= කි.</td></tr>
<tr><td rowspan="3">අවම වැටුප</td><td colspan="2">පැස්සුම්කරුවන් හා වානේ තහඩු පිරිසැකසුම්කරුවන්</td><td colspan="3">රු. 22,500/=</td></tr>
<tr><td colspan="2">අනිකුත් කාර්මික වෘත්තීන්</td><td colspan="3">රු. 21,500/=</td></tr>
<tr><td colspan="2">ලිපිකරුවන් හා නිෂ්පාදන නොවන ශ්‍රේණි</td><td colspan="3">රු. 20,500/=</td></tr>
<tr><td>ඉරිදා දින අතිකාල ගෙවීම</td><td colspan="5">ඉරිදා දින රාජකාරියට පැමිණි අවස්ථාවන්හි පැය 08 ක සේවා කාලය වෙනුවෙන් පැය 24 ක අතිකාල ගෙවනු ඇත.</td></tr>
</table>

## 09 සේවක සුබසාධනය

### (i) නිවාස හා යතුරුපැදි ණය මුදල

(අ) ආයතනය මගින් ලබාදෙනු ලබන නිවාස හා වාහන ණය මුදල පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

නිවාස ණය

| සේවා කාලය | දැනට පවතින නිවාස ණය මුදල | සංශෝධිත ණය මුදල |
|---|---|---|
| වසර 03 සිට 05 දක්වා | 300,000/= | 450,000/= |
| වසර 06 සිට 08 දක්වා | 350,000/= | 525,000/= |
| වසර 09 සිට 12 දක්වා | 400,000/= | 600,000/= |
| වසර 12 ට වැඩි | 500,000/= | 800,000/= |
| වසර 12 ට වැඩි (පරිපාලක) | | 850,000/= |
| වසර 12 ට වැඩි (වැඩමුලික) | | 875,000/= |

වාහන ණය

| ශ්‍රේණි | දැනට පවතින වාහන ණය මුදල | සංශෝධිත ණය මුදල |
|---|---|---|
| කාර්මික හා ලිපිකාර | 250,000/= | 350,000/= |
| වැඩමුලික හා පරිපාලක | 400,000/= | 500,000/= |

(ආ) වාහන ණය මුදල ලබාදීමේදී සම්පූර්ණ කළයුතු සේවා කාලය වසරකින් අඩුකර පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

| ශ්‍රේණි | දැනට පවතින කාලය | සංශෝධිත කාලය |
|---|---|---|
| කාර්මික හා ලිපිකාර | අවුරුදු 05 කාලය | අවුරුදු 04 දක්වා |
| විධමුලික හා පරිපාලක | අවුරුදු 03 කාලය | අවුරුදු 02 දක්වා |

| ශ්‍රේණි | දැනට පවතින පුද්ගලික ණය මුදල | සංශෝධිත ණය මුදල |
|---|---|---|
| CDL සංචිතය | 50,000/= | 100,000/= |

**(ii)** වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ

<table>
<tr><th>කරුණ</th><th>2018</th><th>2019</th><th>2020</th></tr>
<tr><td>බාහිර ප්‍රතිකාර වියදම් ප්‍රතිපූර්ණය කිරීම (බදු වලින් නිදහස් වේ)</td><td>රු. 45,000/=</td><td colspan="2" rowspan="2">වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ 2019 /2020 වර්ෂයන්හි වැඩිවීම එකඟ වු අතර එම වැඩිවන මුදල 2018 නොවැම්බර් හා දෙසැම්බර් කාලයේදී දැනුම් දෙනු ඇත.</td></tr>
<tr><td>නේවාසික ප්‍රතිකාර වියදම් ප්‍රතිපූර්ණය කිරීම (බදු වලින් නිදහස් වේ)</td><td>රු. 172,000/=</td></tr>
<tr><td>රජයේ රෝහලක රෝහල්ගතවීම වෙනුවෙන් එක් දිනක ප්‍රතිපූර්ණය</td><td colspan="3">රු. 2,250/=</td></tr>
<tr><td>පරිපූර්ණ වෛද්‍ය පරීක්ෂණය</td><td colspan="3">රු. 8,000/=</td></tr>
<tr><td>නේවාසික වෛද්‍ය ප්‍රතිකාර CDL කොන්ත්‍රාත් පදනම</td><td colspan="3">රු. 90,000/=</td></tr>
<tr><td>සාමාන්‍ය දරු උපතකදී ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල</td><td colspan="3">සාමාන්‍ය දරු උපතකදී ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල නේවාසික යෝජනා ක්‍රමය යටතේ සම්පූර්ණ බිල්පත් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.</td></tr>
<tr><td>නිවුන් දරු උපතකදී ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල</td><td colspan="3">රු. 30,000/=</td></tr>
<tr><td>රජයේ රෝහලක රෝහල්ගතවීමකදී නිර්දේශිත ඖෂධ පරීක්ෂණ සඳහා ප්‍රතිපූර්ණය කිරීම.</td><td colspan="3">රු. 35,000/=</td></tr>
<tr><td>විශේෂිත ශල්‍යකර්ම ප්‍රතිපූර්ණය කිරීම</td><td colspan="3">විශේෂිත ශල්‍යකර්ම ප්‍රතිපූර්ණය කිරීමේ මුදල රු 400,000/= දක්වා වැඩිකිරීම<br><br>සේවකයින් 10 දෙනෙකු සඳහා ලබාදුන් සහනය ඉතාමත් හදිසි අවස්ථාවකදී තවත් අමතර එක් අයෙකුට ලබාදීමට එකඟවේ.</td></tr>
</table>

(iii) **වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ**

යම් සේවක මහතෙකු/මහත්මියෙකු අදාළ වර්ෂයේ කුමන මාසයක විශ්‍රාම ගියද එම වර්ෂය අවසාන වන තෙක් වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ හැකියාව ඇත.

විශ්‍රාම ගිය දිනයේ සිට ප්‍රතිකාර ගත් බිල් සඳහා සේවක මහතා / මහත්මිය විසින් මුදල් ගෙවීමෙන් පසුව අදාළ බිල්පත් ආයතනය වෙත යොමු කළ යුතුය. අනතුරුව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ මුදල් ඉතිරිව ඇත්නම්, ආයතනයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ පවතින නියමයන්ට යටත්ව බිල්පත් ප්‍රතිපූර්ණය කරනු ඇත.

(iv) **උපැස් යුවලක් මිලදී ගැනීම**

අක්ෂි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත උපැස් යුවලක් මිලදී ගන්නේ නම් එහි රාමුව සඳහා රු. 9000ක මුදල නොවෙනස්ව පවතින අතර, කාචය සඳහා ගෙවනු ලැබූ රු. 3,500 මුදල රු. 5,000ක උපරිමයකට යටත්ව නේවාසික වෛද්‍ය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වේ.

(v) (*අ*) **පැය 24 පුරා ආවරණය වන පුද්ගල හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය.**

| | *2018* | *2019* | *2020* |
|---|---|---|---|
| කාර්මික හා ලිපිකරු ශ්‍රේණිය | 450,000 | 450,000 | 480,000 |
| පරිපාලක ශ්‍රේණි | 475,000 | 475,000 | 505,000 |
| වැඩමූලික ශ්‍රේණි | 500,000 | 500,000 | 530,000 |

(*ආ*) සේවකයෙකු වර්ෂයක කුමන මාසයක විශ්‍රාම ගැන්වුවත් එම සේවකයා අදාළ වර්ෂයේදීම මියගියහොත් එම රක්ෂණාවරණය ලබාදෙනු ඇත.

(*ඇ*) සාමාන්‍ය මරණයක දී සහනක් සැලසීම සඳහා පිරිනමනු ලබන මුදල රු. 300,000 දක්වා සංශෝධනය කෙරේ. එමෙන්ම සේවක මහතෙකු වර්ෂයක කුමන මාසයක විශ්‍රාම ගැන්වුවත් එම වර්ෂයේදීම එම සේවක මහතා මියගියහොත් අදාළ මුදල ලබාදෙනු ඇත.

(vi) **වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට අදාළ වූ දේශීය / පාරම්පරික වෛද්‍ය ආයතන**

* නම්බපාන සුව අසපුව
* මරදන්කඩවල වෙද මැදුර
* හොරිවිල වෙද මහතා - හොරිවිල
* සේන බණ්ඩා වෙද මහතා - වෙදගම
* කුස්වල වෙද හාමුදුරුවෝ
* හුලංගමුව දේශීය වෛද්‍ය ආයතනය - කිරිබත්ගොඩ
* ධර්මසිරි ආයුර්වේද රෝහල මාතර.

(vii) **සේවක මහතෙකුගේ හෝ සේවිකාවකගේ මංගල උත්සව අවස්ථාවන්**

* සේවක මහතෙකුගේ විවාහ උත්සවයක දී මංගල රථය වෙනුවෙන් ලබාදෙන දීමනාව රු. 12,500ක් දක්වා සංශෝධනය කෙරේ.

* මංගල උත්සවය සඳහා මාස 06කට සමාන මූලික වැටුපක් අත්තිකාරම් වශයෙන් වාරික 36කින් ආපසු අය කර ගැනීමේ පදනම මත ලබාදීමට කටයුතු කෙරේ. මෙය ලබාදීමේ දී ව්‍යවස්ථාපිත අඩුකිරීම් සීමාව පිළිබඳව සලකා බලා කටයුතු කරනු ඇත.

* CDL සංචිතයේ සේවකයින් සඳහා ද විවාහ උත්සවයක දී මංගල රථය වෙනුවෙන් රු. 8,500ක දීමනාවක් ලබාදීමට කටයුතු කරනු ඇත.

* CDL සංචිතයේ සේවකයන්ගේ මංගල උත්සවය සඳහා ලබාදෙන අත්තිකාරම් මුදල් ලෙස මාස 03ක වැටුප ලබාදීමට කටයුතු කරන අතර, එය වාරික 36කින් ආපසු අයකර ගැනීමේ පදනම මත ලබාදෙනු ඇත. මෙය ලබාදීමේදී ව්‍යවස්ථාපිත අඩුකිරීම් සීමාව පිළිබඳව සලකා බලා කටයුතු කරනු ඇත.

(viii) **වන්දි මුදල් ගෙවීම / සහනයන් සැලසීම**

* රාජකාරි කාලය තුළ සිදුවන හදිසි අනතුරක දී මියයන සේවක මහතෙකු වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදල රු. 2,500,000 දක්වා සංශෝධනය කෙරේ.
* ආයතනය තුළ දී සිදුවන සාමාන්‍ය සේවක මරණයක දී ලබාදෙනු ලබන රු. 200,000 මුදල රු. 300,000 දක්වා වැඩිකරනු ඇත.
* රු. 1,250,000ක උපරිමයකට යටත්ව ආයතනය තුළ සිදුවන අනතුරක් හේතුවෙන් පූර්ණ හා අර්ධ අකර්මන්‍ය සේවකයින් සඳහා පහත සඳහන් වගුවට අනුව වන්දි මුදල් ලබාදෙනු ඇත.

| බරපතල අනතුර | ඉපයීමේ ශක්තිය නැතිවීමේ ප්‍රතිශතය |
|---|---|
| ස්ථිර වශයෙන් ඔත්පලවීමක් සිදුවන්නාවූද අසාධ්‍ය වූද අවයව අංශභාග තත්වයට පත් කෙරෙන්නාවූ ද අනතුරු | 100 |
| වැඩකිරීමේ ශක්තිය පූර්ණ වශයෙන්ම අක්‍රිය කෙරෙන, ස්ථිර වශයෙන් මානසික ශක්තිය නැති කෙරෙන, සම්පූර්ණ බෙලහීනතාවයට පත් කෙරෙන තුවාල | 100 |
| <u>ඇසේ තුවාල</u> | |
| i ඇස් දෙකේ පෙනීම මුළුමනින්ම නැතිවීම | 100 |
| ii එක් ඇසක පෙනීම මුළුමනින්ම නැතිවීම | 50 |
| <u>ශ්‍රවන අබාධ</u> | |
| i ඇසීමේ හැකියාව සම්පූර්ණයෙන් නැතිවීම | 60 |
| ii එක් කනක පමණක් ඇසීමේ හැකියාව | 30 |
| කතා කිරීමට නොහැකිවීම | 75 |
| <u>ඉන්ද්‍රියයන් අහිමිවීම</u> | |
| i ගඳ සුවඳ හා රස දැනෙන ඉන්ද්‍රියන් මුළුමනින්ම නැතිවීම | 50 |
| ii ගඳ සුවඳ දැනෙන ඉන්ද්‍රියයන් පමණක් මුළුමනින්ම නැතිවීම | 25 |
| iii රස දැනෙන ඉන්ද්‍රිය පමණක් මුළුමනින්ම නැතිවීම | 25 |
| <u>බාහුවේ තුවාල</u> | |
| i වැලමිටෙන් හෝ ඊට ඉහලින් හෝ බාහුව නැතිවීම | 75 |
| ii වැලමිටෙන් පහලින් බාහුව නැතිවීම | 65 |
| <u>අත්වල තුවාල</u> | |
| i අත් දෙකම නැතිවීම | 100 |
| ii අතක් නැතිවීම | 65 |
| iii මාපටැගිල්ල හා ඇඟිලි හතරක් නැතිවීම | 65 |
| iv මාපටැගිල්ල සම්පූර්ණයෙන් නැතිවීම | 35 |
| v මාපටැගිල්ලේ පුරුකක් නැතිවීම | 20 |
| vi ඇඟිලි හතරක් නැතිවීම | 60 |

| බරපතල අනතුර | ඉපයීමේ ශක්තිය නැතිවීමේ ප්‍රතිශතය |
|---|---|
| මැදගිලි, වෙදගිලි, සුලැගිලි නැතිවීම | |
| | 20 |
| i ඇගිලි පුරුක් තුනක් නැතිවීම | 10 |
| ii ඇගිලි පුරුක් දෙකක් නැතිවීම | 05 |
| iii ඇගිලි එක් පුරුකක් නැතිවීම | |
| කකුල නැතිවීම | |
| | 75 |
| i දණ හිසෙන් හෝ ඊට ඉහලින් නැතිවීම | 65 |
| ii දණ හිසෙන් පහලින් නැතිවීම | |
| පාද වල තුවාල | |
| i පා දෙකම නැතිවීම | 100 |
| ii එක් පාදයක් නැතිවීම | 75 |
| පා ඇගිලි නැතිවීම | |
| i පා මාපටගිල්ල (ඇගිලි පුරුක් දෙකක්) නැතිවීම | 20 |
| ii පා මාපටගිල්ල (ඇගිලි පුරුකක්) නැතිවීම | 10 |
| iii පා මාපටගිල්ල හැර ඉතිරි ඇගිල්ලක් නැතිවීම | 10 |
| විවිධ තුවාල | |
| i ලිංගේන්ද්‍රය මුළමනින්ම නැතිවීම | 75 |
| ii ලිංගේන්ද්‍රය අඩ වශයෙන් නැතිවීම | 40 |
| iii මුහුණේ බරපතල කැලල් ඇතිවීම හෝ මුහුණ විරූප වීම | 75 |
| iv මුහුණ හැර ශරීරයේ ඉතිරි කොටස් බරපතල කැලැල් ඇතිවීම හෝ විරූපවීම | 50 |
| v එක් දතක් නැතිවීම | 05 |
| vi ඉහත සඳහන් නොකරන ලද යම් අවයවයක් හෝ ඉන් යම් කොටසක් (උදාහරණ ලෙස නාසය, කණ ආදිය) නැති වීම උපරිමය | 50 |

(ix) **ඖෂධ ලබාගැනීම**

(අ) යම් රෝගයක් සඳහා වෛද්‍ය නිර්දේශ මත එක්වර ඖෂධ ලබාගත හැකි කාලය මාස 03ක් දක්වා ලබාදීමට කටයුතු කරනු ඇත.

(ආ) රෝගී තත්ත්වයකට අදළව වෛද්‍ය නිර්දේශය මත ලබාදෙන විටමින් වර්ග සඳහා වැය වන මුදල් බාහිර වෛද්‍ය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිපූර්ණය කරනු ඇත. රෝගී තත්ත්වය සඳහන් කළ යුතුය.

(ඇ) වෛද්‍ය පරීක්ෂණ බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම සඳහා බාහිර ප්‍රතිකාර යෝජනා ක්‍රමය යටතේ මෙන්ම නේවාසික ප්‍රතිකාර යෝජනා ක්‍රමය යටතේ ද අවස්ථාව ලබාදීමට එකඟවන ලදී.

(x) **සේවක දූදරු ශිෂ්‍යත්වය**

(අ) විශ්ව විද්‍යාල ඉගෙනුම ලබන දූදරුවන් හට ලබා දුන් රු. 4000 ශිෂ්‍යත්ව දීමනාව රු. 5000ක් තෙක් සංශෝධනය කිරීම. එක් සේවකයෙකුගේ දරුවන් දෙදෙනෙකු හට පමණක් මෙම ප්‍රතිලාභය හිමිවනු ඇත.

(ආ) 5 වසර ශිෂ්‍යත්වය සමත් දූ දරුවන් සඳහා පිළිවෙලින් 2018, 2019, 2020 වර්ෂයන් සඳහා 2500, 3000, 3500 ලබාදෙනු ඇත.

(xi) **මරණාධාර ගෙවීම්**

සේවකයෙකු මරණයට පත් වුවහොත් එම සේවක මහතාගේ අවමංගල්‍ය කටයුතු වෙනුවෙන් රුපියල් 150,000ක මුදලක් ආයතනය මගින් සේවක මහතාගේ නීත්‍යානුකූල යැපෙන්නන් වෙත පිරිනැමීමට අමතරව, ආයතනය මගින් සේවක මහතාගේ අවමංගල්‍ය කටයුතු සඳහා වෙනත් අනුග්‍රහයන් ලබානොදෙන නමුත්, ප්‍රවාහන පහසුකම් සඳහා බස් රථ ලබාදීම ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමක් කරනු ඇත.

(xii) **අවමංගල්‍ය අවස්ථාවන්**

සේවක දෙමාපිය/නැන්දනිය හෝ මාමණ්ඩියගේ අවසන් කටයුතු සිදුකරන දිනයේ ලබාදෙන වෑන් රථය දහවල් 11.30න් පසු ලබාදීමට කටයුතු කරන අතර, ඒ සඳහා සහභාගි වන සේවක මහතුන් තමාට හිමි නිවාඩු අයදුම් කිරීමට බැඳී සිටී. වෑන් රථය සඳහා වූ උපරිම දුර ප්‍රමාණය (යාමට සහ ඒමට) කි. මී. 200 දක්වා සංශෝධනය කෙරේ.

(xiii) **වෛද්‍ය යැපීම් දීමනාව**

* සේවයේ යෙදී සිටිය දී සිදුවන හදිසි අනතුරක දී ආබාධිත තත්ත්වයකට ලක්ව වෛද්‍ය නිර්දේශ මත ප්‍රතිකාර ලබා නැවත සේවයට වාර්තා කරන කාලය සඳහා දිනකට රුපියල් 1000 බැගින් ලබාදුන් යැපීම් දීමනාව දිනකට රු. 1500 දක්වා සංශෝධනය කිරීමට කටයුතු කිරීම.

* CDL කොන්ත්‍රාත් ක්‍රමය හෝ සංචිත ක්‍රමය යටතේ සේවයේ නියුතු සේවක මහතෙකු හදිසි අනතුරකට භාජනය වුවහොත් රුපියල් 750ක යැපීම් දීමනාවක් ලබාදීමට කටයුතු කිරීම.
(2008 - 2010 සාමූහික ගිවිසුමේ 13 (ii) (අ) වගන්ති ප්‍රකාරව අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.)

(xiv) **නුවරඑළිය නිවාඩු නිකේතනය වෙන්කර ගැනීම**
ආයතනයේ ස්ථිර සේවකයෙකු විශ්‍රාම යාමෙන් අනතුරුව එම සේවකයාගේ සේවා කාලය තුළ ආයතනයට කළ සේවය ඇගයීම වෙනුවෙන් දින 02 කාලයක් සඳහා නුවරඑළිය නිවාඩු නිකේතනය ආහාරපාන සහ නවාතැන් පහසුකම් සහිතව සමාගම මගින් වෙන්කර දීමට කටයුතු කරනු ඇත. මෙය විශ්‍රාම ගැනීමේ දින සිට පැවති මාස 03ක් ඇතුළත ගැනීමට තිබූ කාලය වසරක් දක්වා සංශෝධනය කෙරේ.

10. ***වැටුප් වර්ධක***

(i) සුබසාධක කටයුතු
සුබසාධක කටයුතු කිරීම සඳහා සුබසාධක සංගමයේ විධායක කමිටුවට ඇතුළත්වීම හේතුවෙන් වාර්ෂික වේතනාධික පිරිනැමීමේ දී විශේෂ අසාධාරණයකට ලක්වන සේවක මහතුන් හට මානව සම්පත් අංශය මැදිහත්ව සාධාරණයක් ඉටු කිරීමට ද, එහිදී උපරිම වේතනාධික 3කට සීමාවනු ඇත.

(ii) විශ්‍රාම යන අවස්ථාවක දී
විශ්‍රාම යන අවස්ථාවේ දී කොන්දේසි වලට යටත්ව දැනට පිරිනමන වැටුප් වර්ධක 03ට අමතරව තවත් වැටුප් වර්ධක 02ක් ලබාදීමට ද එම වැටුප් වර්ධක 02 විශ්‍රාම යන අවස්ථාවේ දී පාරිතෝෂිතය ගණනය කිරීමේ දී ලබාදෙනු ඇත.

(iii) හොඳහිත මත පදනම් වූ විශ්‍රාමික දීමනාව (Ex-gratia Payment)
නියමිත වයස් සීමාව සම්පූර්ණ කර විශ්‍රාම යන සේවක මහත්ම මහත්මීන්ට තමා සේවය කළ එක් වසරක් සඳහා දැනට ගෙවනු ලබන රු. 15,000 දීමනාව ඉදිරියටත් ගෙවනු ඇත. (මෙම කරුණ නැවත 2020 වර්ෂයට අදාළව 2019 වර්ෂයේ දී සාකච්ඡා කිරීමට නියමිතව ඇත.)

11. *නිෂ්පාදනයට ඍජු දයකත්වයක් ලබානොදෙන සීමිත වෘත්තීන්*

2011 - 2013 සාමූහික ගිවිසුමේ 10 වන වගන්තියට අනුව නිෂ්පාදනයට ඍජු දයකත්වයක් ලබා නොදෙන සීමිත වෘත්තීන් සංඛ්‍යාවක් සඳහා හඳුන්වා දුන් නව වැටුප් පරිමාණය සහ අනෙකුත් වෘත්තීන් සඳහා වූ වැටුප් පරිමාණය අතර වෙනස රු. 3,000 දක්වා අඩු කිරීමට ද මෙය 2017 සැප්තැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක කිරීමට ද එකඟ විය.

12. *නිල ඇඳුම්*
සේවක මහතුන්හට වාර්ෂිකව දෙනු ලබන නිල ඇඳුම් පරිහරණයට නුසුදුසු තත්ත්වයේ පවතින්නේ නම් නිල ඇඳුම් 5ක් ඉංජිනේරු මහතාගේ අනුමැතියට යටත්ව ලබාදෙනු ඇත.

13. *ස්ථානුරූපී පදනම මත ආධුනිකයන් බඳවා ගැනීම*

| | |
|---|---|
| • දොඹකර ක්‍රියාකරුවන් | Crane Operator |
| • නැව් ආම්පන්න හසුරුවන්නන් | Rigger |
| • පොම්ප ක්‍රියාකරු/වැද්දුම්කරු | Pump Operator/Fitter |
| • යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු/වැද්දුම්කරු | Plant Operator/Fitter<br>Mechine Operator/Fitter |
| • ආවුද නිකුත් කරන්නන් | Tool Issuer |
| • ගිනිභට | Firemen |
| • තටාක සේවක | Dock Worker |
| • සේවා සැපයුම්කරු/වැද්දුම්කරු | Serviceman/Fitter |
| • වාසස්ථා නිමවුම්කරු/වැද්දුම්කරු | Accommodation outfitter/Fitter |
| • කම්මල්කරු | Blacksmith |
| • වාත්තුකරු | Foundry Worker |
| • ජලනල කාර්මික | Plumber |
| • ගබඩා සේවක | Stores Worker |
| • තාක්ෂණ ශිල්පී තත්ව පාලන | NDT Technician |

ආයතනයට ආවේනික වූ වෘත්තීන් සඳහා ස්ථානුරූපී පදනම මත බඳවා ගැනීමට ද එසේ බඳවා ගනු ලබන පුහුණුවන්නන්ගේ පුහුණුව/විනය පිළිබඳව ගැටළු පවතින්නේ නම් එ පුහුණුවන්නන්ගේ පුහුණුව තවදුරටත් පවත්වාගෙන යන්නේ ද යන්න තීරණය කිරීමේ අභිමතය පාලනාධිකාරිය සතු වන බවත්ය.

පුහුණුවන්නන් ලෙස බඳවා ගැනීමේ දී සේවක දූ දරුවන් හට ප්‍රමුඛතාවය ලබාදීමට සාමූහික ගිවිසුමෙහි සඳහන් ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම.

14. *වරාය වාහන අවසර පත් ලබාදීම*
වැඩමුලික/පරිපාලක/ලිපිකාර හා කාර්මික ශ්‍රේණියේ වාහන බලපත්‍ර ලාභියෙකු විශ්‍රාම ගන්නේ නම් එම බලපත්‍රය අදළ ශ්‍රේණියේ සේවක මහතෙකුට ලබාදීමට එකඟ විය.

15. *ව්‍යාපෘති පදනමේ සේවකයින්ගේ සේවා කාලය එකතු කිරීම*
ව්‍යාපෘති පදනමේ කාලය සේවා කාලයට එකතු කිරීම පිළිබඳව ඉදිරියේදී සාකච්ඡා කර වැඩපිළිවෙලක් සකස් කිරීමට එකඟ විය.

16. *යතුරුපැදි දීමනාව*
රාජකාරින් සඳහා දෛනිකව යතුරුපැදියෙන් ආයතනයෙන් බැහැරව යන අවස්ථාවල දි රාජකාරි දීමනාවක් ලබාදීම, මෙහිදී මේ සඳහා තම පෞද්ගලික යතුරුපැදිය භාවිතා කරන්නේ නම් මෙම දීමනාව ලබාදීමට එකඟ විය.

17. *සේවක සුහදහමුව*
ආයතනයේ සමස්ථ සේවක පාර්ශ්වයන් සඳහා සෑම වර්ෂයකදීම සේවක සුහදහමුව පවත්වනු ඇත.

## සාමූහික ගිවිසුම 2018 / 2020
## වැටුප සහ ඊට ඇතුළත් වන සෙසු දීමනා

| අංක | විෂයය | පවතින ආකාරය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| 1 | මූලික වැටුප | පරිපාලක ශ්‍රේණි සඳහා රු. 771/-<br>වැඩමුලික ශ්‍රේණි සඳහා රු. 964/-<br>මූලික වැටුපට එකතු කෙරේ. | රු. 3,000/- ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම් කොට ගෙන වර්ෂයකට රු.125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ.<br>පරිපාලක ශ්‍රේණි සඳහා රු. 809/- ක්ද<br>වැඩමුලික ශ්‍රේණි සඳහා රු. 1012/- ක්ද<br>සුපා ශ්‍රේණි සඳහා රු. 453/- ක්ද | රු. 3,000/- ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම් කොට ගෙන වර්ෂයකට රු.125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ.<br>පරිපාලක ශ්‍රේණි සඳහා රු. 849/- ක්ද<br>වැඩමුලික ශ්‍රේණි සඳහා රු. 1063/- ක්ද<br>සුපා ශ්‍රේණි සඳහා රු. 476/- ක්ද | රු. 3,000/- ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම් කොට ගෙන වර්ෂයකට රු.125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ.<br>පරිපාලක ශ්‍රේණි සඳහා රු. 891/- ක්ද<br>වැඩමුලික ශ්‍රේණි සඳහා රු. 1116/- ක්ද<br>සුපා ශ්‍රේණි සඳහා රු. 499/- ක්ද |
| 2 | නිෂ්පාදනයට සෘජු ලෙස දායක වන සේවක මහතුන් සඳහා ලබාදෙන දීමනාව | පැය 100 ට වැඩි රු. 1524/-<br>පැය 50< 100 රු. 763/- | පැය 100 ට වැඩි රු.1600/-<br>පැය 50<100 රු. 801/- | පැය 100 ට වැඩි රු. 1680/-<br>පැය 50< 100 රු. 841/- | පැය 100 ට වැඩි රු. 1764/-<br>පැය 50< 100 රු. 883/- |
| 3 | පරිපාලක / වැඩමුලික දීමනාව | පරිපාලක රු. 6,424/-<br>වැඩමුලික රු. 8,030/- | රු. 6745/- දක්වා වැඩි කෙරේ<br>රු. 8432/- දක්වා වැඩි කෙරේ | රු. 7082/- දක්වා වැඩි කෙරේ.<br>රු. 8854/- දක්වා වැඩි කෙරේ. | රු. 7436/- දක්වා වැඩි කෙරේ.<br>රු. 9297/- දක්වා වැඩි කෙරේ. |
|  | පැමිණීමේ දිරි දීමනාව | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු.536.70<br>පරිපාලක හා වැඩමුලික ශ්‍රේණි සඳහා දිනකට රු. 568/- | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු.563.54<br>පරිපාලක හා වැඩමුලික ශ්‍රේණි සඳහා දිනකට රු. 596.40 | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු.591.72<br>පරිපාලක හා වැඩමුලික ශ්‍රේණි සඳහා දිනකට රු. 626.22 | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු.621.31<br>පරිපාලක හා වැඩමුලික ශ්‍රේණි සඳහා දිනකට රු. 657.53 |
|  |  |  | වැඩි කරන ලද මුදල ගෙවනුයේ පැමිණීමේ දීමනාව සම්බන්ධව 2002/2004 සාමූහික ගිවිසුමේ 06 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාද නොවී සේවයට වාර්තා කිරීම වෙනුවෙනි. රටේ ඇති වන හදිසි තත්වයක් හේතුවෙන් ප්‍රමාදවී පැමිණීම / නියමිත කාලයට ප්‍රථම සේවයෙන් මිදීයාම යන අවස්ථාවන්හිදී පැමිණීමේ දීමනාව නියමිත ආකාරයට ගෙවනු ඇත. | | |
| 4 | සේවක ඇගයීම – කාර්මික ශ්‍රේණි / ලිපිකාර / වැඩමුලික හා පරිපාලක වසර 08ක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් වූ මාසික දීමනාව. | ලිපිකාර හා වැඩමුලික හා පරිපාලක ශ්‍රේණි සඳහා රු. 2004 /-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 3610/- | ලිපිකාර හා වැඩමුලික හා පරිපාලක ශ්‍රේණි සඳහා රු. 2104 /-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 3790/- | ලිපිකාර හා වැඩමුලික හා පරිපාලක ශ්‍රේණි සඳහා රු. 2209 /-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 3980/- | ලිපිකාර හා වැඩමුලික හා පරිපාලක ශ්‍රේණි සඳහා රු. 2319 /-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 4179/- |
|  | සේවක ඇගයීම – ලිපිකාර ශ්‍රේණියේ Supra / Snr. Staff Asst. / Staff Asst. සඳහා දීමනාව | Supra Rs 3778/-<br>Snr.Staff Asst. Rs 2014/-<br>Staff Asst. Rs 1606/- | Supra Rs 3967/-<br>Snr.Staff Asst. Rs 2115/-<br>Staff Asst. Rs 1686/- | Supra Rs 4165/-<br>Snr.Staff Asst. Rs 2221/-<br>Staff Asst. Rs 1770/- | Supra Rs 4373/-<br>Snr.Staff Asst. Rs 2332/-<br>Staff Asst. Rs 1858/- |
| 5 | උසස්වීම් නොලබා තම වැටුප්තල කාණ්ඩයේ ඉහළම ශ්‍රේණියේ වසර 4ක් සිටීම වෙනුවෙන් මූලික වැටුපට එකතු කරනු ලබන මුදල | රු. 1250/= | රු. 1312/= | රු. 1378/= | රු. 1447/= |
| 6 | පෞද්ගලික ලිපිකාර දීමනාව | මසකට රු. 3232/= දීමනාවක් | රු. 3394/= | රු. 3564/= | රු. 3742/= |
| 7 | කණ්ඩායම් නායක තනතුර සඳහා | මසකට රු. 2004/= දීමනාවක් | රු. 2104/= | රු. 2209/= | රු. 2319/= |
| 8 | විකිරණ බලපත්‍ර සඳහා | මසකට රු. 2004/= දීමනාවක් | රු. 2104/= | රු. 2209/= | රු. 2319/= |
| 9 | රාත්‍රී වැඩමුරයේ අතිකාල විකිමක් කිරීම වෙනුවෙන් ගෙවන දීමනාව | එක් රාත්‍රී වැඩ මුරයට රු. 1552/= | රු. 1630/= | රු. 1711/= | රු. 1797/= |
|  |  |  | මෙම දීමනාව සංශෝධනය කරනුයේ සියළු දීමනාවන් සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණයක් වෙන අවස්ථාවකදී පමණක් වේ' තවද මෙම දීමනාවට හිමිකම් ලැබෙනුයේ 2014 ජනවාරි 01 දිනට පෙර මෙම වරප්‍රසාදය භුක්ති විඳි සේවක මහතුන් පමණි | | |

## සාමූහික ගිවිසුම - 2018 / 2020
## වැටුපට ඇතුළත් නොවන සෙසු දීමනා

| අංක | විෂයය | | පවතින ආකාරය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| 1 | විදේශ සහභාගීත්ව වෙනුවෙන් වන යැපීම් දීමනාවන් (ආහාර, නවාතැන් පහසුකම් හා ප්‍රවාහන පහසුකම් සහිතව) | ව්‍යාපෘති / නැව් අත්හදාබැලීම් / වසකීම් සහිත කාලසීමාවන් | කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 150 කි.<br>පරිපාලක හා වැඩමුලික ඇ. ඩොලර් 200කි.<br>(මුල් දින 05 සඳහා)<br><br>වැඩිවන සෑම දිනයක් සඳහාම<br>කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 20කි.<br>පරිපාලක හා වැඩමුලික ඇ. ඩොලර් 30කි. | කාර්මික ශ්‍රේණි සඳහා ඇමෙරිකානු ඩොලර් 165 කි.<br>පරිපාලක හා වැඩමුලික ශ්‍රේණි සඳහා ඇමෙරිකානු ඩොලර් 220 කි.<br>(මුල් දින 05 සඳහා)<br><br>වැඩිවන සෑම දිනයක් සඳහාම<br>කාර්මික ශ්‍රේණි ඇමෙරිකානු ඩොලර් 22 කි.<br>පරිපාලක හා වැඩමුලික ශ්‍රේණි සඳහා ඇමෙරිකානු ඩොලර් 33 කි. | | |
| 2 | දොඹකර ක්‍රියාකරුවන්ගේ දක්ෂතා දීමනාව | | රු. 39.80<br>රු. 55.45 | රු.41.79<br>රු.58.22 | රු.43.88<br>රු.61.13 | රු.46.07<br>රු.64.18 |
| 3 | ඉන්ධන දීමනාව | | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා<br>කි. මී. 10 රු. 4.02<br>(එක් ගමන් වාරයක් සඳහා කි. මී. 32 කි)<br>විශේෂ ශ්‍රේණියේ වසර 05ක් සඳහා<br>කි. මී. 10 රු. 8.05<br>( එක් ගමන් වාරයක් සඳහා කි. මී. 40 කි)<br>වැඩමුලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා<br>කි. මී. 10 රු. 11.25<br>( එක් ගමන් වාරයක් සඳහා කි. මී. 40 කි) | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා<br>කි. මී. 10 රු. 4.32<br>(එක් ගමන් වාරයක් සඳහා කි මී.32 කි)<br>විශේෂ ශ්‍රේණියේ වසර 05ක් සඳහා<br>කි. මී. 10 රු. 8.35<br>(එක් ගමන් වාරයක් සඳහා කි.මී. 40 කි)<br>වැඩමුලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා<br>කි. මී. 10 රු. 11.55<br>(එක් ගමන් වාරයක් සඳහා කි.මී. 40 කි) | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා<br>කි. මී. 10 රු. 4.63<br>( එක් ගමන් වාරයක් සඳහා කි. මී. 32 කි)<br>විශේෂ ශ්‍රේණියේ වසර 05ක් සඳහා<br>කි. මී. 10 රු. 8.66<br>( එක් ගමන් වාරයක් සඳහා කි. මී. 40 කි)<br>වැඩමුලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා<br>කි. මී. 10 රු. 11.86<br>( එක් ගමන් වාරයක් සඳහා කි. මී. 40 කි) | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා<br>කි. මී. 10 රු. 4.96<br>( එක් ගමන් වාරයක් සඳහා කි. මී. 32 කි)<br>විශේෂ ශ්‍රේණියේ වසර 05ක් සඳහා<br>කි. මී. 10 රු. 8.99<br>( එක් ගමන් වාරයක් සඳහා කි. මී. 40 කි)<br>වැඩමුලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා<br>කි. මී. 10 රු. 12.19<br>( එක් ගමන් වාරයක් සඳහා කි. මී. 40 කි) |
| 4 | වාහන නඩත්තු දීමනා<br>(නඩත්තු දීමනාව ලබාගැනීම සඳහා අවම වශයෙන් දින 15 ක් රථ වාහනය මගින් සේවයට වාර්තා කළ යුතුය. ) | | වැඩමුලික රු. 4014/=<br>පරිපාලක රු. 3213/= | වැඩමුලික රු. 4215/=<br>පරිපාලක රු. 3374/= | වැඩමුලික රු. 4426/=<br>පරිපාලක රු. 3543/= | වැඩමුලික රු. 4647/=<br>පරිපාලක රු. 3720/= |

මෙයට සාක්ෂි වශයෙන් පාර්ශවයන් 2018 ජූනි මස 25 වනදින අත්සන් තබන ලදී.

ටෝරු ටකෙහාරා - සභාපති
කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සඳහා සහ වෙනුවට
**Toru Takehara**
**Chairman**
**Colombo Dockyard PLC**
**(Company No. PQ 50)**

දෙයියන්දර විදානෙලාගේ අබේසිංහ
කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී
කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සඳහා සහ වෙනුවට
**D.V. ABEYSINGHE**
Managing Director/CEO
Colombo Dockyard PLC
(Company No. PQ 50)

අබේසිංහ ආරච්චිගේශ්‍යාමල් කුමාර ලක්ප්‍රිය අබේසිංහ
ලේකම්
ස්වාධීන තටාක සේවක සංගමය සඳහා සහ වෙනුවට
ස්වාධීන තටාක සේවක සංගමය
කොළඹ ඩොක්යාඩ් පී.එල්.සී
තැ. පෙ. 906,
කොළඹ 15.
ලියාපදිංචි අංකය 5373

මැටරඹ කෝරළගේ තිලකසිරි
සභාපති
ස්වාධීන තටාක සේවක සංගමය සඳහා සහ වෙනුවට
ස්වාධීන තටාක සේවක සංගමය
කොළඹ ඩොක්යාඩ් පී.එල්.සී
තැ. පෙ. 906,
කොළඹ 15.
ලියාපදිංචි අංකය 5373

සාක්ෂිකරුවන්

වලිමුනි මංගල දුමින්ද ද සිල්වා
සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන හා පාලන)
කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සඳහා සහ වෙනුවට
**Mangala De Silva**
General Manager
(Human Resource Development & Administration)
Colombo Dockyard PLC
(Company No. : PQ50)

සේවා ගමගේ සරත්චන්ද්‍ර
සංවිධායක
ස්වාධීන තටාක සේවක සංගමය සඳහා සහ වෙනුවට

ඉහත සඳහන් ටෝරු ටකෙහාරා, දෙයියන්දර විදානෙලාගේ අබේසිංහ, අබේසිංහ ආරච්චිගේ ශ්‍යාමල් කුමාර ලක්ප්‍රිය අබේසිංහ, මැටරඹ කෝරළගේ තිලකසිරි, යන අයගේ අත්සන් වලට සාක්ෂිකරුවෝය.

# Non Executive Salary Scales - For 2017 - 2020

## Salary Scales - A (01st Jan 2017 - 31st Dec 2020)

| Work Category | Grade | SCALE | | | | |
|---|---|---|---|---|---|---|
| | | Initial Point | Inc. Rate | X | Steps | Conclusion Point |
| Industrial | SP | 25500 | 510 | X | 75 | 63750 |
| | HG | 24000 | 480 | X | 75 | 60000 |
| | I | 22500 | 450 | X | 75 | 56250 |
| | II | 21500 | 430 | X | 75 | 53750 |
| | III | 20500 | 410 | X | 75 | 51250 |
| | IV | 19500 | 390 | X | 75 | 48750 |
| Supervisory (Support) | I | 29300 | 585 | X | 75 | 73175 |
| | II | 28800 | 575 | X | 75 | 71925 |
| | III | 28300 | 565 | X | 75 | 70675 |
| Supervisory (Secondary) | I | 29500 | 590 | X | 75 | 73750 |
| | II | 29000 | 580 | X | 75 | 72500 |
| | III | 28500 | 570 | X | 75 | 71250 |
| Supervisory (Primary) | I | 30000 | 600 | X | 75 | 75000 |
| | II | 29500 | 590 | X | 75 | 73750 |
| | III | 29000 | 580 | X | 75 | 72500 |
| Foreman (Support) | SP | 32450 | 650 | X | 75 | 81200 |
| | HG | 31950 | 640 | X | 75 | 79950 |
| | I | 31450 | 630 | X | 75 | 78700 |
| | II | 31050 | 620 | X | 75 | 77550 |
| Foreman (Secondary) | SP | 33350 | 665 | X | 75 | 83225 |
| | HG | 32850 | 655 | X | 75 | 81975 |
| | I | 32350 | 645 | X | 75 | 80725 |
| | II | 31850 | 635 | X | 75 | 79475 |
| Foreman (Primary) | SP | 34350 | 685 | X | 75 | 85725 |
| | HG | 33850 | 675 | X | 75 | 84475 |
| | I | 33350 | 665 | X | 75 | 83225 |
| | II | 32850 | 655 | X | 75 | 81975 |

| Work Category | Grade | SCALE | | | | |
|---|---|---|---|---|---|---|
| | | Initial Point | Inc. Rate | X | Steps | Conclusion Point |
| Technical (Secondary) | SP | 33350 | 665 | X | 75 | 83225 |
| | HG | 32850 | 655 | X | 75 | 81975 |
| | I | 32350 | 645 | X | 75 | 80725 |
| | II | 31850 | 635 | X | 75 | 79475 |
| | III | 29500 | 590 | X | 75 | 73750 |
| | IV | 29000 | 580 | X | 75 | 72500 |
| Technical (Primary) | SP | 34350 | 685 | X | 75 | 85725 |
| | HG | 33850 | 675 | X | 75 | 84475 |
| | I | 33350 | 665 | X | 75 | 83225 |
| | II | 32850 | 655 | X | 75 | 81975 |
| | III | 30000 | 600 | X | 75 | 75000 |
| | IV | 29500 | 590 | X | 75 | 73750 |
| Clerical | Supra | 32450 | 650 | X | 75 | 81200 |
| | SP | 28000 | 560 | X | 75 | 70000 |
| | HG | 26000 | 520 | X | 75 | 65000 |
| | I | 23000 | 460 | X | 75 | 57500 |
| | II | 22000 | 440 | X | 75 | 55000 |
| | III | 21000 | 420 | X | 75 | 52500 |

## Salary Scales - B (01st Sep 2017 - 31st Dec 2019)

**Cook, Asst Cook, Kitchen Helper, Driver, Cleaner, Security Guard, Chaser, Medical Attendant & Asst, Stores Workers etc**

| Work Category | Grade | SCALE | | | | |
|---|---|---|---|---|---|---|
| | | Initial Point | Inc. Rate | X | Steps | Conclusion Point |
| Industrial | SP | 21000 | 420 | X | 75 | 52500 |
| | HG | 20000 | 400 | X | 75 | 50000 |
| | I | 19000 | 380 | X | 75 | 47500 |
| | II | 18000 | 360 | X | 75 | 45000 |
| | III | 17000 | 340 | X | 75 | 42500 |
| | IV | 16000 | 320 | X | 75 | 40000 |
| Supervisory | I | 26000 | 520 | X | 75 | 65000 |
| | II | 25000 | 500 | X | 75 | 62500 |
| | III | 24000 | 480 | X | 75 | 60000 |
| Foreman | SP | 30000 | 600 | X | 75 | 75000 |
| | HG | 29000 | 580 | X | 75 | 72500 |
| | I | 28000 | 560 | X | 75 | 70000 |
| | II | 27000 | 540 | X | 75 | 67500 |



PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA